## WEATHER FORECAST FOR 26 OCTOBER 2019

**(Issued at 05.30 a.m. on 26 October 2019)**

**Due to the atmospheric disturbance developing to the Southeast of Sri Lanka, showery condition is likely to enhance over the island (particularly in the Northern, Eastern, North-Central and Uva provinces) from tonight.**

Showers or thundershowers will occur at times in Eastern, Northern, North-central and Uva provinces and heavy falls about 100 mm can be expected at some places.

Showers or thundershowers will occur elsewhere after 1.00 p.m.

Misty conditions can be expected at some places in Central, Sabaragamuwa, Uva and North-central provinces during the morning.

**General public is kindly requested to take adequate precautions to minimize damages caused by temporary localized strong winds and lightning during thundershowers.**

දිවයිනට ගිනිකොණ දෙසින් වායුගෝලයේ වර්ධනය වෙමින් පවතින කැළඹිලි ස්වභාවය හේතුවෙන් අද රාත්‍රී කාලයේ සිට දිවයිනේ (විශේෂයෙන් උතුර, නැගෙනහිර, උතුරු-මැද සහ ඌව පළාත්වල) වැසි තත්ත්වය වර්ධනය වන ලකුණු ඇත.

නැගෙනහිර, උතුර, උතුරු මැද සහ ඌව පළාත්වල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. ඇතැම් ස්ථාන වලට මි.මී.**100** පමණ තද වර්ෂාපතනයන් ඇති විය හැක.

දිවයිනේ සෙසු ප්‍රදේශවල සවස **1.00** න් පමණ පසුව වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

මධ්‍යම, සබරගමුව, ඌව සහ උතුරු-මැද පළාත්වල ඇතැම් ස්ථාන වල උදෑසන කාලයේදී මීදුම් සහිත තත්ත්වයක් බලාපොරොත්තු විය හැක.

ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මඟින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

## WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS (Issued at 05.30 a.m. on 26 October 2019)

**Due to the low level atmospheric disturbance in the south-eastern sea area**, the possibility for heavy showers/thundershowers and sudden roughness, associated with sudden increase of wind speed (up to 70-80 kmph) in the sea areas coast extending from Hambanthota to Kankasanturai via Batticaloa and Trincomalee is high. **Naval and fishing communities are requested to be vigilant in this regard.**

Showers or thundershowers will occur in the sea areas around the island. Heavy showers can be expected in the deep sea area to the Southeast and East of the island.

Winds will be South-westerly to North-westerly and speed will be (20-40) kmph in the sea areas around the island. The sea area extending from Hambanthota to Kankasanturai via Batticaloa and Trincomalee can be fairly rough at times as the wind speed can increase up to **50** kmph at times.

**Temporarily strong gusty winds (up to 70-80 kmph) and very rough seas can be expected during thundershowers.**

**ඉදිරි පැය 24 සඳහා දිවයින වටා ඇති මුහුදේ කාලගුණ තත්ත්වය**
**2019 ඔක්තෝබර් මස 26 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.**

දිවයිනට ගිණිකොන දෙසින් වන මුහුදු ප්‍රදේශයේ පහළ වායුගෝලයේ පවතින කැළඹිලි ස්වභාවය හේතුවෙන්, හම්බන්තොට සිට මඩකළපුව සහ ත්‍රිකුණාමලය හරහා කන්කසන්තුරය දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල තද වැසි ඇතිවිය හැකි අතර සුළං වේගය ක්ෂණිකව (පැ.කි.මී. 70-80 පමණ) ඉහළ යාමට ඉඩ ඇති හෙයින් එම මුහුදු ප්‍රදේශ ක්ෂණිකව රළු වීමට වැඩි හැකියාවක් පවතී. ධීවර සහ නාවුක ප්‍රජාවට මේ පිළිබඳව ඉතා අවධානයෙන් කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටිනු ලැබේ

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. දිවයිනට ගිනිකොණ සහ නැගෙනහිර දෙසින් වන ගැඹුරු මුහුදු ප්‍රදේශවල තද වර්ෂාපතනයන් ඇති විය හැක.

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං නිරිත සිට වයඹ දක්වා වන දිශා වලින් හමන අතර සුළගේ වේගය පැ.කි.මී. (20-40) පමණ වේ.

හම්බන්තොට සිට මඩකළපුව සහ ත්‍රිකුණාමලය හරහා කන්කසන්තුරය දක්වා මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. **50** දක්වා ඉහළ යාමට හැකියාවක් පවතින අතර එම මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළු විය හැක.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල (පැ.කි.මී. **70-80** දක්වා) තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date : 2019/10/26
Time : 0539hrs

KMRodrigo

කාලගුණ විද්‍යාඥ (Duty Meteorologist),
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (Department of Meteorology)